| **ප්‍රවාහන උපකරණ** | **61121** | **159,479,400** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **159,479,400** |
| මගී වාහන | 6112101 | 152,325,000 | - | - | - | - | - | - | - | - | - | 152,325,000 |
| කෘෂිකාර්මික වාහන | 6112103 | 7,100,000 | - | - | - | - | - | - | - | - | - | 7,100,000 |
| යතුරු පැදි | 6112109 | 54,400 | - | - | - | - | - | - | - | - | - | 54,400 |
| | උප එකතුව | **159,479,400** | - | - | - | - | - | - | - | - | - | **159,479,400** |
| **වෙනත් යන්ත්‍ර හා උපකරණ** | **61122** | **155,323,029** | **4,362,246** | **298,272** | **-** | **125,500** | **-** | **4,535,018** | **-** | **-** | **-** | **159,858,046** |
| කාර්යාලීය උපකරණ | 6112201 | 32,494,191 | 733,255 | 134,512 | - | 1,500 | - | 866,267 | - | - | - | 33,360,458 |
| පරිගණක උපකරණ | 6112202 | 40,635,309 | 3,535,400 | - | - | 84,500 | - | 3,450,900 | - | - | - | 44,086,209 |
| විද්‍යුත් උපකරණ | 6112203 | 12,191,882 | 23,250 | 12,300 | - | 26,500 | - | 9,050 | - | - | - | 12,200,932 |
| සන්නිවේදන උපකරණ | 6112204 | 5,123,779 | - | 70,800 | - | - | - | 70,800 | - | - | - | 5,194,579 |
| ගෘහභාණ්ඩ | 6112205 | 64,789,693 | 70,341 | 80,660 | - | 13,000 | - | 138,001 | - | - | - | 64,927,693 |
| මුළුතැන්ගෙයි උපකරණ | **6112218** | 88,175 | - | - | - | - | - | - | - | - | - | 88,175 |
| | උප එකතුව | **155,323,029** | **4,362,246** | **298,272** | - | **125,500** | - | **4,535,018** | - | - | - | **159,858,046** |
| **වෙනත් මූල්‍ය නොවන වත්කම්** | **6113** | **-** | **-** | **-** | **35,202,190** | **-** | **35,202,190** | **-** | **-** | **-** | **-** | **-** |
| **නොනිමි වැඩ** | **61131** | **-** | **-** | **-** | **35,202,190** | **-** | **35,202,190** | **-** | **-** | **-** | **-** | **-** |
| | උප එකතුව | - | - | - | **35,202,190** | - | **35,202,190** | - | - | - | - | - |
| **4 නැවත නැවත ජනනය නොවන වත්කම්** | **614** | **1,048,507,000** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **1,048,507,000** |
| **ඉඩම්** | **6141** | 1,048,507,000 | - | - | - | - | - | - | - | - | - | 1,048,507,000 |
| | උප එකතුව | **1,048,507,000** | - | - | - | - | - | - | - | - | - | **1,048,507,000** |

***2020/01/01 දිනට ආරම්භක ශේෂය වැරදි නිවැරදි කිරීම හා සිගාස් වැඩසටහනට ඇතුලත් නොකළ වටිනාකම ඇතුලත් කිරීම හේතුවෙන් වෙනස් වී ඇත.**

# 2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2020.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය : 273 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -පුත්තලම

| අනු අංකය | බැංකුවේ නම | ගිණුම් අංකය | 2020.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.) | 2020.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.) | 2020.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| 1 | මහජන බැංකුව | 9026975 | 164,315,697 | - | - | 2020 දෙසැම්බර් |
| 2 | ලංකා බැංකුව | 7042153 | 62,808,165 | - | - | 2020 දෙසැම්බර් |
| 3 | ලංකා බැංකුව | 7042144 | 14,088,845 | - | - | 2020 දෙසැම්බර් |
| 4 | ලංකා බැංකුව | 7042147 | 8,561,639 | - | - | 2020 දෙසැම්බර් |
| 5 | මහජන බැංකුව | 9026978 | 17,055,772 | - | - | 2020 දෙසැම්බර් |
| 6 | මහජන බැංකුව | 9026994 | 7,388,815 | - | 137,971 | 2020 දෙසැම්බර් |
| 7 | ලංකා බැංකුව | 7042159 | 10,078,165 | - | - | 2020 දෙසැම්බර් |
| 8 | මහජන බැංකුව | 9026990 | 11,248,659 | - | - | 2020 දෙසැම්බර් |
| 9 | ලංකා බැංකුව | 7042160 | 5,605,942 | - | - | 2020 දෙසැම්බර් |
| 10 | ලංකා බැංකුව | 7042156 | 24,680,568 | - | - | 2020 දෙසැම්බර් |
| 11 | ලංකා බැංකුව | 7042162 | 8,336,906 | - | - | 2020 දෙසැම්බර් |
| 12 | මහජන බැංකුව | 9026981 | 14,719,159 | - | - | 2020 දෙසැම්බර් |
| 13 | මහජන බැංකුව | 9026984 | 22,465,579 | - | - | 2020 දෙසැම්බර් |
| 14 | ලංකා බැංකුව | 7042165 | 11,152,857 | - | - | 2020 දෙසැම්බර් |
| 15 | ලංකා බැංකුව | 7042151 | 22,213,053 | - | - | 2020 දෙසැම්බර් |
| 16 | මහජන බැංකුව | 9026987 | 12,759,406 | - | - | 2020 දෙසැම්බර් |
| 17 | ලංකා බැංකුව | 7042168 | 9,459,198 | - | - | 2020 දෙසැම්බර් |
| 18 | මහජන බැංකුව | 9026996 | 5,387,791 | - | - | 2020 දෙසැම්බර් |

**ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.**

..............................................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/

අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2021.01.12

එච්.එම්.එම්.එච්. [illegible],

ප්‍රධාන ගණකාධිකාරී,

දිස්ත්‍රික් ලේකම් වෙනුවට,

පුත්තලම.

## 3. 5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස |
| 2002.02.99 | පොළිය - අනිකුත් | 8,800 | 8,000 | 8,359 | 104.5% |
| 2003.02.99 | විකුණුම් හා ගාස්තු - විවිධ | 500 | 250 | 193 | 77.2% |
| 2003.03.02 | විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම | 0.004 | 0.002 | 0.001 | 50% |
| 2003.99.00 | විකුණුම් හා ගාස්තු - අනිකුත් ලැබීම | 10,500 | 10,500 | 85,794 | 817% |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | **821,700** | **821,700** | **805,609** | **98 %** |
| ප්‍රාග්ධන | **47,800** | **47,800** | **46,956** | **98 %** |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වල නියෝජිතයෙක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව හා වියදම් විස්තරය/බාණ්ඩය | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගත්<br>ලද ප්‍රතිපාදන, ලබා<br>ත් අවසාන ප්‍රතිපාදන |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය | වකුගඩු රෝග නිවාරණ | 0.27 | 0.27 | 0.27 | 100% |
| 2 | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කටයුතු | 7.93 | 7.93 | 7.93 | 100% |
| 3 | උසස් අධ්‍යාපන තාක්ෂණ හා නවෝද්පාදන අමාත්‍යාංශය | විද්‍යාතා වැඩසටහන | 0.12 | 0.12 | 0.12 | 100% |
| | | යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා | 0.07 | 0.07 | 0.07 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 0.45 | 0.45 | 0.45 | 100% |
| 4 | බුද්ධශාසන සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 0.78 | 0.78 | 0.78 | 100% |
| | | පරිගණක මිලදී ගැනීම | 0.12 | 0.12 | 0.12 | 100% |
| | | සංස්කෘතික මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම | 2.14 | 2.14 | 2.05 | 96% |
| | | විහාරස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම සඳහා - අතැතිබිල් | 1.98 | 1.98 | 1.98 | 100% |
| | | ඌණ සංවර්ධිත දහම්පාසල් වැඩි දියුණු කිරීම- අතැතිබිල් | 19.34 | 19.34 | 19.34 | 100% |
| | | විහාර ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම- අතැතිබිල් | 10.30 | 10.30 | 10.28 | 99.8% |
| | | තිරසර පුන්‍යග්‍රාම වැඩසටහන - අතැතිබිල් | 4.93 | 4.93 | 4.92 | 99.8% |
| | | වයඹ උදාන සංවර්ධිත වැඩසටහන සඳහා- අතැතිබිල් | 10.28 | 10.28 | 10.28 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 0.08 | 0.08 | 0.08 | 100% |
| 5 | මුදල් අමාත්‍යාංශය | ගම්පෙරලිය | 69.86 | 69.86 | 69.65 | 99.7% |
| | | සපිරිගම / RIDP | 672.95 | 672.95 | 602.97 | 90% |
| 6 | මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය | පුහුණු වැඩසටහන් සඳහා | 0.40 | 0.40 | 0.40 | 100% |
| | | DCB | 39.17 | 39.17 | 39.17 | 100% |
| | | ගම්පෙරලිය | 182.00 | 182.00 | 182.00 | 100% |
| | | සපිරිගම / RIDP | 433.73 | 433.73 | 433.60 | 100% |
| | | ආගමික මධ්‍යස්ථාන සඳහා | 14.66 | 14.66 | 14.66 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 26.10 | 26.10 | 26.05 | 100% |
| 7 | අධිකරණ අමාත්‍යාංශය | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 0.06 | 0.06 | 0.059 | 98 % |
| | | පුනරාවර්තන වියදම් | 5.51 | 5.51 | 4.03 | 73% |
| 8 | සෞඛ්‍ය අමාත්‍යාංශය | වකුගඩු රෝග නිවාරණ | 1.61 | 1.61 | 1.11 | 69% |
| | | පුනරාවර්තන වියදම් | 0.02 | 0.02 | 0.02 | 100% |
| 9 | වෙළඳ අමාත්‍යාංශය | පුනරාවර්තන වියදම් | 0.88 | 0.88 | 0.60 | 68% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10 | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | පුහුණු වැඩසටහන් සඳහා | 0.13 | 0.13 | 0.13 | 100% |
| | | ධීවර තොටුපල සංවර්ධනය - අතැතිබිල් | 1.93 | 1.93 | 1.93 | 100% |
| | | ධීවර නිවාස හා සනීපාරක්ෂක - අතැතිබිල් | 1.11 | 1.11 | 1.11 | 100% |
| | | වැවක් සමඟ ගමක් - අතැතිබිල් | 2.77 | 2.77 | 2.77 | 100% |
| | | කලපු සංරක්ෂණ හා සංවර්ධන - වැවක් සමඟ ගමක් - අතැතිබිල් | 18.70 | 18.70 | 18.70 | 100% |
| | | අතැතිබිල් - ජනාධිපති ලේකම් කාර්යාලය | 0.53 | 0.53 | 0.53 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 15.83 | 15.83 | 15.83 | 100% |
| 11 | කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | පුහුණු වැඩසටහන් සඳහා | 0.06 | 0.06 | 0.06 | 100% |
| | | පෝෂණ දීමනා | 128.48 | 128.48 | 128.48 | 100% |
| | | පෙර පාසල් ගුරු දීමනා | 0.20 | 0.20 | 0.20 | 100% |
| | | උදෑසන ආහාර | 1.93 | 1.93 | 1.93 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 0.36 | 0.36 | 0.36 | 100% |
| 12 | ඉඩම් අමාත්‍යාංශය | ඉඩම් වන්දි ගෙවීම | 5.14 | 5.14 | 4.42 | 86% |
| | | ඉඩම් සඳහා දීමනා පත්‍ර ලබා දිම | 0.20 | 0.20 | 0.20 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 1.48 | 1.48 | 1.20 | 81% |
| 13 | බුද්ධශාසන සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය | සංස්කෘතික මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම | 0.42 | 0.42 | 0.42 | 100% |
| | | අළුත්වැඩියා කටයුතු සඳහා | 1.16 | 1.16. | 1.16 | 100% |
| 14 | කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | තනි මා පිය පවුල් | 0.05 | 0.05 | 0.05 | 100% |
| | | ආබාධිත දීමනා | 106.44 | 106.44 | 106.44 | 100% |
| | | වැඩිහිටි දීමනා | 419.47 | 419.47 | 419.45 | 100% |
| | | සියවස් සපිරි දීමනා | 0.32 | 0.32 | 0.32 | 100% |
| | | වකුගඩු දීමනා | 10.17 | 10.17 | 10.17 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 0.32 | 0.32 | 0.32 | 100% |
| 15 | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | පුහුණු වැඩසටහන් සඳහා | 0.04 | 0.04 | 0.04 | 100% |
| | | අතැතිබිල්-2019 | 0.38 | 0.38 | 0.38 | 100% |
| | | ස්වාභාවික විපත් සඳහා වන්දි | 18.06 | 18.06 | 18.06 | 100% |
| | | නිවාස වන්දි | 0.63 | 0.63 | 0.63 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 74.89 | 74.89 | 74.89 | 100% |
| 16 | නිපුණතා සංවර්ධන රැකීරක්ෂා කම්කරු සබඳතා අමාත්‍යාංශය | පේෂ කර්මාන්ත සඳහා | 0.25 | 0.25 | 0.25 | 100% |
| | | වෘත්තීය පුහුණු | 0.01 | 0.01 | 0.01 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 0.12 | 0.12 | 0.12 | 100% |
| 17 | ධීවර අමාත්‍යාංශය | ධීවර පියස වැඩසටහන සඳහා | 1.23 | 1.23 | 1.02 | 83% |
| 18 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 0.74 | 0.74 | 0.74 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 202.75 | 202.75 | 202.75 | 100% |
| 19 | අධිකරණ මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | සංවර්ධන වැඩසටහන් | 0.17 | 0.17 | 0.17 | 100% |
| | | පුහුණු වැඩසටහන් සඳහා | 0.42 | 0.42 | 0.42 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 2.16 | 2.16 | 2.16 | 100% |
| 20 | නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය | සුකිතපුර වැඩසටහන - අතැතිබිල් | 15.88 | 15.88 | 15.88 | 100% |
| 21 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | පුනරාවර්තන වියදම් | 0.13 | 0.13 | 0.11 | 85% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 22 | තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රීඩාපිටි සංවර්ධන - අතැතිබිල් | 1.91 | 1.91 | 1.91 | 100% |
| | | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 0.51 | 0.51 | 0.51 | 100% |
| | | යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 0.39 | 0.39 | 0.38 | 97% |
| | | පුහුණු වැඩසටහන් සඳහා | 0.60 | 0.60 | 0.23 | 38% |
| | | පුනරාවර්තන වියදම් | 14.52 | 14.52 | 14.50 | 100% |
| 23 | කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | පුනරාවර්තන වියදම් | 1.39 | 1.39 | 1.39 | 100% |
| 24 | වාරිමාර්ග අමාත්‍යාංශය | පුහුණු වැඩසටහන් සඳහා | 0.28 | 0.29 | 0.28 | 97% |
| | | පුනරාවර්තන වියදම් | 0.99 | 0.99 | 0.81 | 82% |
| 25 | බෞද්ධ කටයුතු පිළිබඳ කටයුතු දෙපාර්තමේන්තුව | පුහුණු වැඩසටහන් සඳහා | 0.04 | 0.04 | 0.04 | 100% |
| | | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 0.20 | 0.20 | 0.20 | 100% |
| | | දහම් ගුරු දීමනා | 13.26 | 13.26 | 13.15 | 99% |
| | | පුනරාවර්තන වියදම් | 1.00 | 1.00 | 0.90 | 90% |
| 26 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | මුස්ලිම් ආගමික මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය | 1.36 | 1.36 | 1.36 | 100% |
| 27 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | ක්‍රිස්තියානි ආගමික කටයුතු සඳහා | 0.16 | 0.16 | 0.16 | 100% |
| 28 | සංස්කෘතික කටයතු දෙපාර්තමේන්තුව | අතැතිබිල් -2019 | 0.05 | 0.05 | 0.05 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 2.94 | 2.94 | 2.69 | 91% |
| 29 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | පුනරාවර්තන වියදම් | 0.95 | 0.95 | 0.75 | 79% |
| 30 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | අළුත්වැඩියා කටයුතු සඳහා | 0.19 | 0.19 | 0.19 | 100% |
| | | CBR | 0.34 | 0.34 | 0.34 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 9.45 | 9.45 | 7.84 | 83% |
| 31 | පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | පුහුණු වැඩසටහන් සඳහා | 0.45 | 0.45 | 0.45 | 100% |
| | | වෛද්‍ය අධාර | 0.42 | 0.42 | 0.42 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 0.29 | 0.29 | 0.28 | 97% |
| 32 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | පුනරාවර්තන වියදම් | 1.45 | .1.45 | 1.37 | 94% |
| 33 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | පුනරාවර්තන වියදම් | 14.44 | 14.44 | 13.43 | 93% |
| 34 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | නිරෝධායනය වන පවුල් සඳහා සහන සැලසීම | 60.47 | 60.47 | 60.07 | 99% |
| 35 | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | වාහන අළුත්වැඩියා සඳහා | 0.13 | 0.13 | 0.13 | 100% |
| | | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 0.06 | 0.06 | 0.06 | 100% |
| | | ප්‍රවාහන කටයුතු සඳහා | 0.40 | 0.40 | 0.40 | 100% |
| | | පුනරාවර්තන වියදම් | 4.20 | 4.20 | 2.00 | 48% |
| 36 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | වැන්දඹු අනන්දරු දීමනා | 23.80 | 23.80 | 23.42 | 98% |
| | | පුනරාවර්තන වියදම් | 0.11 | 0.11 | 0.10 | 91% |
| 37 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | රෙජිස්ට්‍රාර් වරුන්ගේ දීමනා | 1.62 | 1.62 | 1.62 | 100% |
| 38 | වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වන අලි වන්දි ගෙවීම | 3.14 | 3.14 | 2.49 | 79% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **39** | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | පුනරාවර්තන වියදම් | **0.02** | **0.02** | **0.00** | 0% |
| **40** | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | පුනරාවර්තන වියදම් | **0.60** | **0.60** | **0.53** | **88%** |
| **41** | අධිකරණ මානව හිමිකම් සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | පුනරාවර්තන වියදම් | **0.05** | **0.05** | **0.05** | **100%** |
| **42** | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | හිඟ බිල්පත් - **2019** | **0.34** | **0.34** | **0.22** | **65%** |
| | | කාර්යාල උපකරණ මිලදී ගැනීම | **0.10** | **0.10** | **0.10** | **100%** |
| | | පුහුණු වැඩසටහන් සඳහා | **0.62** | **0.62** | **0.59** | **95%** |
| | | පුනරාවර්තන වියදම් | **0.32** | **0.32** | **0.30** | **94%** |
| **43** | මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | පුහුණු වැඩසටහන් සඳහා | **0.10** | **0.10** | **0.08** | **80%** |
| | | පුනරාවර්තන වියදම් | **0.54** | **0.54** | **0.50** | **93%** |
| **44** | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව | පුහුණු වැඩසටහන් සඳහා | **0.11** | 0.11 | 0.10 | **91%** |
| | | බහුකාර්ය සංවර්ධන නිලධාරී දීමනා | **52.89** | **52.89** | **50.22** | **95%** |
| | | පුනරාවර්තන වියදම් | **2.22** | **2.22** | **2.12** | **95%** |
| **45** | ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ක්‍රීඩා පාසල් සංවර්ධන වැඩසටහන | **23.51** | **23.51** | **19.13** | **81%** |
| **46** | කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | පුහුණු වැඩසටහන් සඳහා | **2.31** | **2.31** | **2.21** | **96%** |
| | | පෙර පාසල් සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබාදීම | **2.37** | **2.37** | **2.31** | **97%** |
| | | පෙර පාසල් සංවර්ධන කටයුතු සඳහා | **0.44** | **0.44** | **0.44** | **100%** |
| | | පෝෂණ දීමනා | **65.03** | **65.03** | **65.00** | **100%** |
| | | උදෑසන ආහාර | 0.59 | **3.93** | **0.59** | **15%** |
| | | පෙරපාසල් ගුරු දීමනා | **0.60** | **0.60** | **0.58** | **97%** |
| | | පුනරාවර්තන වියදම් | **0.35** | **0.35** | **0.30** | **86%** |
| **47** | වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | කාර්යාල උපකරණ මිලදී ගැනීම | **0.08** | **0.08** | **0.07** | **88%** |
| | | පුහුණු වැඩසටහන් සඳහා | **0.16** | **0.16** | **0.16** | **100%** |
| | | පුනරාවර්තන වියදම් | **0.89** | **0.89** | **0.84** | **94%** |
| **48** | අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | කාර්යාල උපකරණ මිලදී ගැනීම | **1.33** | **1.33** | **1.21** | **91%** |
| | | හිඟ බිල්පත් - **2019** | **0.81** | **0.81** | **0.81** | **100%** |
| | | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | **0.13** | **0.13** | **0.12** | **92%** |
| | | යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | **0.03** | **0.03** | **0.03** | **100%** |
| | | කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම | **3.50** | **3.50** | **3.50** | **100%** |
| | | ඉදිකිරීම් | **0.20** | **0.20** | **0.20** | **100%** |
| | | ස්වාභාවික විපත් සඳහා වන්දි | **2.82** | **2.82** | **2.40** | **85%** |
| | | නිවාස වන්දි | **1.06** | **1.06** | **1.00** | **94%** |
| | | භාණ්ඩ මිලදී ගැනීම | **0.03** | **0.03** | **0.02** | **67%** |
| | | පුනරාවර්තන වියදම් | **110.71** | **110.71** | **110.23** | **100%** |
| **49** | විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළෙඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය | පුහුණු වැඩසටහන් සඳහා | **0.03** | **0.03** | **0.03** | **100%** |
| | | පුනරාවර්තන වියදම් | **8.00** | **8.00** | **7.40** | **93%** |
| **50** | සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා ව්‍යාපාර සංවර්ධන සහ ඌණ | ග්‍රාම ශක්ති - හිඟ බිල්පත් | **20.90** | **20.90** | **20.04** | **96%** |
| | | ගෙවතුවගා වැඩසටහන | **21.39** | **21.39** | **21.04** | **98%** |
| | | ආබාධිත දීමනා | **43.71** | **43.71** | **43.59** | **100%** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | වැඩිහිටි දීමනා | 129.86 | 129.86 | 128.16 | 99% |
| | | වකුගඩු දීමනා | 19.04 | 19.04 | 18.74 | 98% |
| | | සියවස් සපිරි දීමනා | 0.23 | 0.23 | 0.20 | 87% |
| | | පුනරාවර්තන වියදම් | 0.20 | 0.20 | 0.18 | 90% |
| 51 | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | නැවත පදිංචි කිරීම් - අතැතිබිල් | 26.15 | 26.15 | 26.13 | 100% |
| 52 | දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාතයාංශය | පුනරාවර්තන වියදම් | 0.05 | 0.05 | 0.04 | 80% |
| 53 | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 0.09 | 0.09 | 0.07 | 78% |
| | | පුනරාවර්තන වියදම් | 0.15 | 0.15 | 0.12 | 80% |
| 54 | වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු,පලතුරු,මිරිස්,ළූණු හා අර්ථාපල් වගා ප්‍රවර්ධනය ,බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය | පුහුණු වැඩසටහන් සඳහා | 0.31 | 0.31 | 0.20 | 65% |
| | | පුනරාවර්තන වියදම් | 8.76 | 8.76 | 8.10 | 92% |
| 55 | පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය | පුනරාවර්තන වියදම් | 0.10 | 0.10 | 0.08 | 80% |
| 56 | පශු සම්පත්, ගොවිපළ ප්‍රවර්ධන සහ කිරි බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන - අතැතිබිල් | 5.50 | 5.50 | 5.50 | 100% |
| 57 | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | සනීපාරක්ෂාව පිළිබඳ දකුණු ආසියානු සමුළුව | 7.60 | 7.60 | 6.75 | 89% |
| 58 | බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය | අත්සළු ත්‍රිකෝණය බල ගැන්වීම | 3.00 | 3.00 | 2.90 | 97% |
| | | | 3272.24 | 3275.59 | 3175.95 | 97% |

### 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1,250,196 | 1,250,196 | තක්සේරු කිරීමට යොමුකර ඇත. | 90% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 319,337 | 319,337 | ............ | 100% |
| 9153 | ඉඩම් | 1,048,507 | 1,048,507 | ............. | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

මගේ අංකය / எனது இல. / My No. NWP/PT/A/PUT.D.S./02/20/797
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021 මැයි 21 දින

ගණන්දීමේ නිලධාරී,
පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

**පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

යථෝක්ත මූල්‍ය ප්‍රකාශනය සහතික කර ඉංග්‍රීසි හා දෙමළ පිටපත් ද මේ සමඟ ඉදිරිපත් කරමි.

එම්.එස්. නයනකුමාර
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත:- 01. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
02. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරය



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. NWP/PT/A/PUT.D.S./02/20/797
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021 මැයි 21

ගණන්දීමේ නිලධාරි,
පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

**පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021මැයි 21 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින්

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### ආදායම් ලැබීම්

#### අත්හැරීම්

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 267/2018 හා 2018 නොවැම්බර් 21 දරන චක්‍රලේඛනයේ 8.2 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි හඳුනාගෙන පිරිවැය හෝ තක්සේරු අංගය ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වුවත්, වත්කම් 12ක වටිනාකම් ඉඩම් හා ගොඩනැඟිලි යටතේ වෙන වෙනම දැක්වීමට වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබූ අතර, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වසම් 06 ක ඉදිකර තිබූ සේවා පියස හා ඒවා පිහිටි ඉඩම් එසේ ගිණුම්ගත කර නොතිබුණි.

### 1.6.2 අක් මුදල් ගැලපුම් ගිණුම

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 හි VI ඡේදය ප්‍රකාරව අක්මුදල් ගැලපීම් ගිණුම පිළියෙල කර නොතිබුණි.

#### 1.6.2.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.2,618,040,805 ක් වූ අතර, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව හා ඒසීඒ 6 ආකෘතිය අනුව පිළියෙල කර තිබුණු මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.2,552,542,130 ක් වූයෙන් රු.65,498,675 ක් නොසැසඳීමක් නිරීක්ෂණය විය.

#### 1.6.2.2 තැන්පතු ගිණුම් ශේෂ

තැන්පත් කළ දින සිට වසර දෙක ඉක්ම වූ තැන්පතු ගිණුම් වර්ග 07 කට අදාල එකතු වටිනාකම රු.50,679,629 ක් වූ පොදු තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගිණුම්ගත කර තිබුණු භෞතික වත්කම් ඉදිකිරීම්, ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වටිනාකම රු.46,956,248 ක් වූ නමුත්, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම් ලෙස රු.39,862,708 ක් සටහන් කර තිබුණු අතර, රු.7,093,540 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| 2020 ජනවාරි 03 දිනැති 01/2017 (1) දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක ගොඩනැඟිලි පිළිබඳ තොරතුරු 2020 ජනවාරි 20 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, එම තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි. |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| 2018 ජනවාරි 24 දිනැති 02/2018 දරන චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම සහ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, සෑම කාර්ය මණ්ඩල සාමාජිකයෙකුටම වර්ෂයකට අවම පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබාදීමේ අවශ්‍යතාවය ඉටු නොවී තිබුණි. |
| <u>2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 චක්‍රලේඛය</u><br>i. 3.1 ඡේදය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 11 ක ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | | වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ PA-3872 දරන කැබ් රථයේ ඉන්ධන පරීක්ෂා කිරීමේ දී කිසිදු අධීක්ෂණ නිලධාරියෙකු ඒ සඳහා සහභාගී වී වගකීම භාර ගෙන නොතිබූ අතර, රියදුරුගේ සනාථන මත ප්‍රාදේශීය ලේකම් විසින් ධාවන කිලෝමීටර ප්‍රමාණය තීරණය කර තිබූ බව නිරීක්ෂණය විය. |
| ii. | 3.3 ඡේදය | මහවැව සහ හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉන්ධන පරීක්ෂාව සිදුකල කැබ් රථ දෙකක ඉන්ධන දැවීම අධික බව අනාවරණය වී තිබූ නමුත්, උක්ත චක්‍රලේඛයේ 3.3 වගන්තිය ප්‍රකාරව එය කාර්මික දෝෂයක් දැයි පරීක්ෂාවට සුදුසුකම් ලත් මෝටර් රථ පරීක්ෂකයෙකු වෙත යොමු කර නොතිබුණි. |
| iii. | 4.3 ඡේදය | සිදුකල සියළු අළුත්වැඩියාවන් සඳහා ම ඉදිරිපත් වූ මිල ගණන් සාධාරණ දැයි සුදුසුකම් ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් මඟින් සහතික කරවාගත යුතු වුවත්, මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විගණිත දින වනවිටත්, සිදුකර තිබූ අළුත්වැඩියාවන් පිළිබඳ ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

වෙනත් චක්‍රලේඛ

---

| | |
|---|---|
| 2019 දෙසැම්බර් 01 දිනැති මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ සංවර්ධන චක්‍රලේඛ අංක 01/2019 හි 08 ඡේදය | "සපිරිගමක්" ප්‍රජාපාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ කල්පිටිය, ආණමඩුව, නවගත්තේගම සහ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති පිළිවෙලින් 62ක්, 97ක්, 55ක් සහ 51 ක් සම්බන්ධයෙන් ග්‍රාමීය මාර්ග පඩිපෙල, |

බෝක්කු, කුඩා පාලම් පැතිකාණු යන ක්ෂේත්‍රයට පමණක් ප්‍රමුඛතාවය ලබාදී ක්‍රියාත්මක කර තිබුණු අතර, චක්‍රලේඛය මගින් ප්‍රමුඛතාවය ලබාදී තිබුණු ක්ෂේත්‍ර 08ම ආවරණය වන පරිදි ව්‍යාපෘති තෝරාගෙන ක්‍රියාත්මක කිරීම කෙරෙහි වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

### 2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 262/2017 හා 2017.12.29 දිනැති චක්‍රලේඛනයේ 04 වගන්තිය ප්‍රකාරව විශ්‍රාම ගිය හෝ මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය ශේෂයන් අත්තිකාරම් බී ගිණුමෙන් නොපෙන්වීමට ආයතන ප්‍රධානීන් වගබලා ගතයුතු වුවත්, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන් 12 දෙනෙකුගේ එකතුව රු.1,503,469 ක් වූ ණය ශේෂ නිරවුල් කරගෙන නොතිබුණු අතර, නිරවුල් නොවූ ණය ශේෂ පියවා ගැනීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක වර්ෂ 1 – 5 ත් අතර කාලයක සිට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් නිදෙනෙකුගෙන් අයකර ගත යුතු ණය ශේෂවල එකතු වටිනාකම රු.224,156 ක් විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) මුදල් රෙගුලාසි 34 ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමෙන් තොරව ලැබෙන ප්‍රතිපාදන මුදලට ඇස්තමේන්තු පිළියෙල කර ක්‍රියාත්මක කිරීම නිසා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 කට අදාලව රු.25,463,412 ක් වැයකර තිබූ ව්‍යාපෘති 55 ක් මහජනතාවට වෙත ප්‍රතිලාභ ලැබීමකින් තොරව වසර කිහිපයක සිට

නිශ්කාර්යව පවතින අතර, ඒ සඳහා වැය කළ රාජ්‍ය අරමුදල් නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ආ) මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2019 ගම්පෙරළිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 20 කට අදාලව එකතුව රු.876,495 ක රඳවුම් මුදල් අඩුකර ගෙවීම් කර තිබූ නමුත්, නඩත්තු කාලය තුළ හඳුනාගත් දෝෂ නිවැරදි කර නොතිබුණි.

(ඇ) මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩ සටහන යටතේ වියදම් එකතුව රු.39,456,345 ක් වූ ජල ව්‍යාපෘති 21 ක් ද මුළු වියදම රු.889,180 ක් වූ වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 24 ක් ද මුළු වියදම රු.6,321,436 ක් වූ මාතෘ සායන සංවර්ධන ව්‍යාපෘති 06 ක් ද, ක්‍රියාත්මක කර තිබුණ ද, එම ව්‍යාපෘතිවල හා ඊට සමාන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රතිලාභ ජනතාවට ලැබී තිබේ ද, යන්න පරීක්ෂා කර සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - 2020 යටතේ රු.495,000ක වැඩ නිමි වටිනාකමක් වූ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පහළ කොස්වාඩිය මාතෘ හා ළදරු සායනය මධ්‍යස්ථානයේ කාමරයේ ගෙබිම සඳහා නිසි පරිදි කොන්ක්‍රීට් යොදා සකස් කළයුතු වුවත්, ස්ථාන 06 ක දී පිපුරුම් දක්නට ලැබුණි. එසේ තිබිය දී අවසන් ගෙවීම් කටයුතු සිදුකර තිබුණි. වඩිම්බු සඳහා රු.6,034 ක් වැයකර තිබුණ ද, ඒවා නිසි පරිදි සවිකර නොතිබුණි.

(ඉ) කලපු සංරක්ෂණ හා සංවර්ධන ව්‍යාපෘති යටතේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2019 වර්ෂයේ දී කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු.775,143ක් වැයකර වන්නිමුන්දලම කලපු තීරයට ගල් ඇතිරීම සම්බන්ධව ව්‍යාපෘතියේ දී කලපු තීරයට විධිමත්ව ගල් අතුරා නොතිබුණු අතර, තැනින් තැන ගල් දමා තිබීම සහ මෙම ව්‍යාපෘතිය ඉටුකිරීමේ අපේක්ෂිත අරමුණු වූයේ කලපු තීරය ආරක්ෂා කර ගැනීම වුවත්, ව්‍යාපෘතිය ඉටුකර තිබුණු ආකාරයෙන් එකී අරමුණු ඉටු වී තිබූ බව නිරීක්ෂණය නොවුණි.

### 3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහකුඹුක්කඩවල ග්‍රාමීය රෝහල පවත්වාගෙන ගිය පැරණි බහුකාර්ය රෝහල් ගොඩනැගිල්ල හා රෝහල් නිල නිවාසය පිළිසකර කර භාවිතයට ගතහැකි තත්ත්වයේ පැවතිය ද 2010 වර්ෂයේ දී අබලන් මාර්ග හා ගමනාගමන දුෂ්කරතා හේතුවෙන් රෝහල් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාථමික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පිහිටුවා මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආසන්නව "වැවපිටිය" ලෙස හඳුන්වනු ලබන ප්‍රදේශයකට ගෙනයාම හේතුවෙන් පැරණි බහුකාර්ය රෝහල් ගොඩනැගිල්ල නිශ්කාර්යව විනාශවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) 2008 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර 2012 වර්ෂයේ ඉදිකිරීම් සම්පූර්ණ කර තිබූ මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 614/ඒ කිවුල 4 – I මධ්‍යම බෙහෙත් ශාලාව, ජල ටැංකිය හා අනෙකුත් වත්කම් සහිත ගොඩනැගිලි පරිශ්‍රය මහජන අයිතියට පත් නොකර නිශ්කාර්යව විනාශවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුහුදුකර ජනතාවගේ විවේක කාලය ගත කිරීම සඳහා ක්‍රියාශීලි දරු පරපුරක් ඇති කිරීමේ අරමුණින් බටහිර ඉරණවිල ළමා උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා තිබුණු අතර, එය බටහිර ඉරණවිල අනුරේඛා අංක PU/MHW/2016/122 නම් බිම් කොටසේ ඉදිකර තිබුණි. මෙය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව අයත් වන අතර, විගණිත දින වනවිට මුහුදු ජලය ව්‍යාපෘතිය ඉදිකල ස්ථානයටම පැමිණ ඇති බව නිරීක්ෂණය විය. තවදුරටත් වෙරළ ඛාදනය වුවහොත් ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකල රු.927,000 ක මුදල නිශ්කාර්ය වියදමක් වන බවත්, වෙරළ ඛාදනය වැළැක්වීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්, ව්‍යාපෘතිය සඳහා භූමිය තෝරා ගැනීමේ දෝෂයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2019 වර්ෂයේ ගම්පෙරළිය වැඩසටහන යටතේ ආරම්භ කල පානීය ජල ව්‍යාපෘති 07 ක් අර්ධ වශයෙන් නිමකර තිබූ අතර, එම ව්‍යාපෘති සඳහා 2020 වර්ෂයේ ප්‍රතිපාදන නොලැබීම තුළ ජල පාරිභෝගියන් සඳහා ජලය ලබාදීමට නොහැකි වී තිබුණි.

(ඉ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2020 සපිරිගමක් වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති හා 2019 වර්ෂයේ විමධ්‍යගත අරමුදල් මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති සහ 2019 වර්ෂයේ ගම්පෙරළිය යටතේ ක්‍රියාත්මක ප්‍රතිපාදන රු.200,000 ක් ඉක්මවූ ව්‍යාපෘති 06ක් ක්‍රියාත්මක කිරීම දෝෂ හේතුවෙන් එම ව්‍යාපෘති 06 ම නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැද/කිරිමැටියාන නෙළුම්වැව ජල ව්‍යාපෘතිය සඳහා 2020 සපිරිගමක් යටතේ රු.2,000,000 ක් අනුමත කර තිබුණ ද, පාරිභෝගිකයින්ට අඛණ්ඩව ජලය ලබාදීමට නම් ප්‍රථමයෙන් ම මෙම ව්‍යාපෘතිය සඳහා ජල ටැංකියක් ඉදිකිරීම කටයුතු කළයුතු වුවත්, වෙන්කල ප්‍රතිපාදන උපයෝගී කරගෙන ජලනල මිලදී ගැනීමට කටයුතු කර තිබුණි

(උ) 2014 වර්ෂයේ අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වන ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දෙමටපිටිය ජල ව්‍යාපෘතිය ( 2017) ජල ටැංකිය ඉදිකිරීම, ජල මෝටරය හා ජලනල හා උපාංග සඳහා රු.2,289,588 ක් වියදම් කර තිබුණ ද, 2021 පෙබරවාරි 05 දින විගණන ස්ථානීය පරීක්ෂා කිරීම අනුව ජල ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට අවශ්‍ය ඉදිරි මූල්‍ය පහසුකම් ලැබී නොතිබීම මත පවුල් 300 කට අධික පිරිසකට ලබා ගැනීමට ඇති පානීය ජල අවශ්‍යතාව ලැබී නොමැතිව නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(ඌ) කුමාරකට්ටුව ජල ව්‍යාපෘතිය 2014 වාර්ෂික අයවැය යෝජනා යටතේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.3,884,248ක ප්‍රතිපාදන මත කුමාරකට්ටුව ප්‍රදේශයට ජලය ලබාදීම සඳහා එම ප්‍රදේශයේ ප්‍රජාමූල සමිතියක් මගින් ටැංකිය ඉදිකිරීම, මෝටරය හා ජලනල හා උපාංග සඳහා රු.2,204,798ක් ද, ජල මූලාශ්‍රය හා ගේට්ටුව ඉදිකිරීම ආදී වියදම් දරා තිබුණ ද, 2021 පෙබරවාරි 05 දින විගණන පරීක්ෂා කිරීම අනුව එම ප්‍රදේශයේ ජනතාවට ජලය ලබාදීමට හැකි තත්ත්වයට ගෙන ඒමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(එ) පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් "සපිරිගමක්" ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රු.1,980,000 ක මුදලක් වියදම් කර ඉදිකර තිබුණු සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු නිමකර මාස 05 ක් ගතවී තිබුණ ද, වසමේ දරුවන්ගේ බර කිරීමට හා

ගැබිනි මව්වරුන්ට සායන කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් වගකිව යුතු නිලධාරීන් වෙත ලබාදී නොතිබුණි. ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබූ ගොඩනැගිල්ල අදාල කාර්යය සඳහා භාවිතයට නොගැනීම හේතුවෙන් ගොඩනැගිල්ල තුළ අපවිත්‍ර ස්වභාවයක් දක්නට ලැබුණි.

(ඒ) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉහළ අත්තන්ගනය පෙර පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම අදාලව ඇස්තමේන්තු විස්තර, සැලසුම් පරීක්ෂා කිරීමේ දී දිග අඩි 40 ක් හා පළල අඩි 20 ක් වන මෙම ඉදිකිරීම වලට අදාල රු.1,311,916 ක් වූ අවසන් වැඩ නිම් බිල්පතින් රජයේ දායකත්වය ලෙස රු.990,000 ක් , රු.99,000 ක් වූ රඳවුම් අඩුකර ගෙවා තිබුණ ද, වහලය සකස් කිරීමේ සැලැස්ම හා ද්‍රව්‍ය ඉදිකිරීම අතරතුර අතිරේක වැඩ ඇස්තමේන්තුවකට ලිඛිත අනුමැතිය නොමැතිව වෙනස් කිරීම මත ගොඩනැගිල්ලේ ඇතුළත අඩි 9 අඟල් 3 ක් දිග කොටසක් DPC මට්ටම (Plinth beam රහිතව) දක්වා පමණක් ඉදිකර තිබුණි. ඒ අනුව මෙම ඉදිකිරීම අසම්පූර්ණ ව්‍යාපෘතියක් බවට පත්වී තිබුණි.

(ඔ) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2020 දෙසැම්බර් 24 දින රු.417,250 ක් වටිනාකම වූ කාය වර්ධන උපකරණ තොගයක් ප්‍රාදේශීය සභාවේ කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට මිලදීගෙන ලබාදී තිබුණ ද, විගණිත දින වූ 2021 ජනවාරි 05 දින වනවිටත්, එම බඩු තොගය නිවැරදිව සවි කිරීම් තාක්ෂණික දැනුම සහිත උපදෙස් මත සිදුකරන බව නිරීක්ෂණය නොවූ අතර එම කාය වර්ධන උපකරණ භාවිතා කිරීමේ වැඩ පිළිවෙලක් ද සකස් කර නොතිබුණි.

(ඕ) ඇස්තමේන්තු වටිනාකම රු.1,936,131ක් වූ වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි දිග මීටර් 13.1 ක් ද, පළල මීටර් 5.4 ක් ද විශාල වූ ප්‍රධාන බස් නැවතුම්පල හා කොන්ක්‍රීට් පේව්මන්ට් ද පළල මීටර් 8.6 ක් හා දිග මීටර් 26.5 ක් ද වන කොන්ක්‍රීට් කැටගල් අල්ලා සංවර්ධනය කර තිබූ විවෘත භූමියක් ද සහිතව 2014 වර්ෂයේ දී ඉදිකර තිබුණි. එම භූමිය 2021 පෙබරවාරි 23 දින පරීක්ෂා කිරීමේ දී ඉදිකල දින සිට නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය වූ අතර, එම පරිශ්‍රය ගවයන්ගේ නවාතැන් පලක් බවට පත්වී ඇති බව නිරීක්ෂණය විය.

(ක) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කරතිව් එම බස් නැවතුම් පොළ භූමියේ ම ඊට ආසන්න කාලයේ දී කොන්ක්‍රීට් කණු 12 ක් මත ඉදිකර තිබූ දිග මීටර් 12.4 ක් ද, පළල මීටර් 3.2 ක් වන සතිපොළ ගොඩනැඟිල්ලක් සහ කොන්ක්‍රීට් කණු 18 ක් මත ලී වහලය සහ ඇස්බැස්ටස් වහලය සහිතව ඉදිකර ඇති සතිපොල ගොඩනැඟිල්ල ද ඉදිකල දින සිට නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(ඛ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බොරළු යොදා මාර්ග සංවර්ධනය විගණන නියැදි පරීක්ෂා කිරීම් අනුව එක් මාර්ගයක බොරළු දැමූ ආසන්න කාලයක වර්ෂාව ඇතිවීම හා ඒ සමඟ රථවාහන ධාවනය වීමෙන් මාර්ගයේ වළවල් සහ කාණු ස්වභාවයක් බවට පත්වී තිබුණු බැවින්, රඳවුම් මුදල් නිදහස් කිරීමට පෙර එය සකස් කළයුතු බව නිරීක්ෂණය විය. බොරළු දැමූ මාර්ග රෝල් භාවිතයෙන් තලා තිබුණ ද මාර්ගයේ දෙපස මාර්ග මායිමට ආසන්න මිලිමීටර් 300 ක් පමණ ප්‍රමාණවත් පරිදි තැලීමට ලක් වී නොමැති බව නිරීක්ෂණය විය. ඒ සඳහා හේතු වී තිබුණේ සභාව සතුව හෝ කුඩා ප්‍රජාමූල සංවිධාන සතුව හෝ ග්‍රාමීයව ඒ සඳහා භාවිතාකරන යන්ත්‍රයක් (Rammer/Vager) නොමැති වීමය.

(ග) පළාත් නිශ්චිත සංවර්ධන වැඩසටහන - 2019 ගැමි අරුණෝදය ග්‍රාම සංවර්ධන විශේෂ වැඩසටහන යටතේ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වෙලේවැව - දකුණ ගම්මානයේ ඉදිකර තිබූ බහුකාර්ය ගොඩනැඟිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යනය වාර්තාව අනුව ව්‍යාපෘතියේ අරමුණු සහ මෙම ගොඩනැඟිල්ලෙන් අපේක්ෂිත ප්‍රතිඵල හා ප්‍රතිලාභ රැසක් ඉදිරිපත් කර තිබුණ ද, විගණන දිනය වන 2021 පෙබරවාරි 19 දින වනවිටත්, මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීමේ අරමුණු සඵල කර ගැනීම සඳහා යොදාගෙන නොතිබුණි. මෙම බහුකාර්ය ගොඩනැඟිල්ලට යාබදව භාවිතයට ගතහැකි සුදුසු වෙනත් ගොඩනැඟිල්ලක් තිබිය දීත්, නව ගොඩනැඟිල්ල මරණාධාර සමිති රැස්වීම් පැවැත්වීම සඳහා පමණක්ම භාවිතා කරනු ලබන බවට නිරීක්ෂණය විය.

(ඝ) නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ දී ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන යටතේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ රු.1,500,000 ක ප්‍රතිපාදන මත වෙලේවැව උතුර දේශීය ආයුර්වේද නිෂ්පාදන හා අලෙවි මධ්‍යස්ථානය ඉදිකිරීම සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ භෞතික පරීක්ෂාවේ දී ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ

වැඩසටහන යටතේ 2017 වර්ෂයේ දී රු.1,485,000 ක් වැයකර ඉදිකිරීම් කටයුතු නිමකර වසර තුනකට වැඩි කාලයක් ගතවී තිබුණ ද, එම ගොඩනැගිල්ල අදාල කාර්යය සඳහා යොදා නොගෙන ඉදිකිරීම් කටයුතු නිමකල දින සිට නිශ්කාර්යව පැවති අතර, ඉදිකිරීම් කටයුතු අවසන්කර වර්ෂ තුනකට වැඩි කාලයක් ගතවී තිබුණු එම ගොඩනැගිල්ල, ඉදිකිරීමේ අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙන් වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සඳහා විගණිත දින වන විටත්, වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි. එම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමේ දී අවශ්‍ය වන ජල සැපයුම් හා විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා ඇස්තමේන්තුගත කර නොතිබුණු අතර, එය ඇස්තමේන්තු සැකසීමේ දුර්වලතාවයක් බවත් නිරීක්ෂණය වූ අතර, ආයුර්වේද නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබුණු බව ලිපිගොනුව පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(න) ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2018 යටතේ රු.797,990 ක වියදමක් දරා ඉදිකර තිබූ වඩිගමංගාව වොලිබෝල් ක්‍රීඩාපිටිය ආවරණය කර තිබූ දැල විගණන දිනය වූ 2021 මාර්තු 03 දින වනවිට ස්ථාන කිහිපයකින් ම ඉරා දමා තිබූ අතර, ක්‍රීඩාපිටිය භාවිතා කිරීමට නොහැකි වන අන්දමින් වල් වැදී තිබුණ අතර, එබැවින් ව්‍යාපෘතියෙහි අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වීම මත ඒ සඳහා වැයකළ වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

### 3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

---

මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2014 වර්ෂයේ දී ආරම්භ කරන ලද ජනසෙත ප්‍රජාමූල ජල ව්‍යාපෘතිය - කිවුල තරුණ ව්‍යාපාරය යටතේ ජල ටැංකියක්, පොම්පාගාරයක් (මෝටර් ගෙය) ළිඳ හා ජලනල එළීම් කටයුතු සිදුකිරීම සඳහා රු.10,232,645 ක් වියදම් වී තිබුණ ද විගණිත දින වූ 2021 මාර්තු 03 වන විටද ඉතිරි ජලනල හා උපාංග, කොටසක අඩුපාඩුව මත ජල ව්‍යාපෘතියේ ප්‍රතිලාභ අදාල ජනතාවට ලැබී නොතිබුණි.

### 3.1.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කලපු සංකරක්ෂණ හා සංවර්ධන ව්‍යාපෘති යටතේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ දී කෘෂි කර්ම, පශු සම්පත් සංවර්ධන වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන ලැබී තිබුණු එකතු වටිනාකම රු.5,544,000 ක් වූ ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම මත නිදහස් කර තිබුණු ප්‍රතිපාදිත මුදල් ආපසු යවා තිබුණි.

(ආ) ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වර්ෂ 2015 සිට 2019 දක්වා කාලය තුළ රු.7,725,000 ක මුදලක් වියදම් කර ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 18ක් නිම නොකර අත්හැර දමා තිබුණු අතර, එම ව්‍යාපෘති නිමකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

### 3.2 ප්‍රසම්පාදනයන්

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ලංසු ඇගයීමේ දී බදුරහිත මිල ගණන් සලකා බැලිය යුතු වුවද, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිශ්චිතව සඳහන් කර තිබුණ ද, බදු සහිත මිල ගණන් ලංසු ඇගයීමට භාවිතා කර තිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථයේ ඇන්ජින් අංක හා චැසි අංක ලියාපදිංචි ලේඛන සමඟ නොසැසඳෙන බැවින්, දුම් පරීක්ෂණය හා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව මාර්ගයේ ධාවනය වන බව නිරීක්ෂණය වේ.

(ආ) උතුරු සිරිගම්පල හා දකුණු කොලින්ජාඩිය ඉඩම්වල පිහිටි නිල සෙවන කාර්යාල ඉදිකර තිබුණ ද, අදාල ඉඩම් වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් වෙත පවරාගෙන නොතිබුණි.

(ඈ) හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිහරණය සඳහා කැබරථ දෙකක් ලබාදී තිබුණු අතර, එක් කැබරථය ලියාපදිංචි පොත කාර්යාලයේ නොතිබූ අතර, එය වත්කම් ලේඛනය අනුව වටිනාකම රු.5,500,000 ක් ලෙස දක්වා තිබුණි. එහි පරම අයිතිය (Absolute owner) කොළඹ 01 හි මෙට්‍රොපොලිටන් ලංකා බැංකු ශාඛාව සතු බව නිරීක්ෂණය විය.

## 3.4 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ග්‍රාම ශක්ති ගම්මානවල සංවර්ධන වැඩසටහන යටතේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ දී ඉටුකර තිබුණු ව්‍යාපෘති 20 ක් වෙනුවෙන් ගෙවිය යුතු බිල්පත්වල එකතු වටිනාකම රු.21,799,245 ක් විගණිත දිනවන 2021 පෙබරවාරි 11 දින වනවිටත්, ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත කලපු සංරක්ෂණ හා සංවර්ධන ව්‍යාපෘති යටතේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ දී රු.1,930,253 ක මුදලක් වැයකර ඉදිකර තිබුණු සෝත්තුපිටිය ප්‍රජාශාලාවෙහි ඉදිකිරීම් නියමිත ප්‍රමිතියට සිදුකර නොතිබීම හේතුවෙන් බිත්ති සහ බිම තැනින් තැන පුපුරා ගොස් තිබුණි.

(ඇ) වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ගම්පෙරළිය වැඩසටහන යටතේ නිවාස සෙවිලි කර ගැනීම සඳහා ප්‍රතිලාභීන් 373 සඳහා නිවාස ආධාර ලබාදී තිබුණි. එකී ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී නිශ්චිතවම ඉඩම් හිමිකම් ඇති පුද්ගලයන් සොයාගෙන ඔවුන් සඳහා ආධාර ලබාදිය යුතු වුවත්, උක්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී එසේ සොයා බැලීමෙන් තොරව ආධාර ලබාදී තිබුණි.

(ඈ) කර්මාන්තවල නඩත්තු කාලය අවසන් වූ විගස එම කර්මාන්ත පරීක්ෂා කර බලා අඩුපාඩු පවතීනම් කඩිනමින් නිමකරවා ගෙන රඳවුම් මුදල් ගෙවීමට කටයුතු කළයුතු වුවද, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නඩත්තු කාලය අවසන් වූ ව්‍යාපෘති 25 ක් වෙනුවෙන් රඳවුම් මුදල වූ රු.2,178,000 ක් ද, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නඩත්තු කල ව්‍යාපෘති 11ක් වෙනුවෙන් රඳවුම් මුදල වූ රු.341,872ක් ද,

පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති 35 ක රඳවුම් මුදල වූ රු.2,551,705 ක් සහ ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කල ව්‍යාපෘති 150 හි රඳවුම් මුදල වන 4,663,650 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

(ඉ) නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මුල්ලේගම නව නිල සෙවන කාර්යාලය ගොඩනැඟිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු.2,015,000 ක මුදලක් වියදම් කර තිබුණ ද, ගොඩනැගිල්ල පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන ජල සැපයුම හා විදුලි සම්බන්ධතාවය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන් ම ඉදිකිරීම් කටයුතු නිසි ප්‍රමිතියට අනුව ඉටුකර නොතිබීම හේතුවෙන් බිත්තිවල හා බිමෙහි ඉරිතැලීම් දක්නට ලැබුණි. මෙම කර්මාන්තය සඳහා ශක්‍යතා අධ්‍යනයක් සහ බිම් සැලැස්මක් පිළියෙල නොකර ඉදිකිරීම් සිදුකර නොතිබුණි.

(ඊ) නැවත පදිංචි කළ ගම්මානවල යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ ඉටුකර තිබුණු ව්‍යාපෘති 14ක් වෙනුවෙන් ගෙවිය යුතු බිල්පත් වල එකතු වටිනාකම රු.12,397,220 ක මුදලක් විගණිත දිනවන 2020 පෙබරවාරි 01 දින වන විටත්, ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බත්තුළුඔය, සෙංගල් ඔය සහ සුරුවිල යන ග්‍රාම නිලධාරී වසම්වල පවත්වාගෙන යන අනවසර ඉස්සන් ගොවිපලවල් 22 ක් සහ වර්තමානය වනවිට අක්‍රිය තත්ත්වයේ පවතින ගොවිපලවල් 04 ක් පිළිබඳව තොරතුරු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට 2019 හා 2020 වර්ෂවලදී යොමු කර තිබුණ ද, ඒ සම්බන්ධව එම ආයතනය ගත් ක්‍රියාමාර්ග පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ඌ) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් 590 ආනවිළුන්දාව ග්‍රාම නිලධාරී වසමේ නගුල්එළිය හා මුතුපංතිය යන ගම්මාන වෙරළ ඛාදනය හා මුහුදු රළ ගොඩගැලීම් හේතුවෙන් බලපෑමට ලක්වන බව නිරීක්ෂණය වූ අතර, එම බලපෑම් මත ඇතිවන පීඩාවන් පාලනය කිරීමට විධිමත් හා ස්ථිර වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(එ) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරී හා ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සමඟ මුතුපංතිය ගම්මානයේ වෙරළ තීරය නිරීක්ෂණය කිරීමේ දී

මීටර් 400 ක් පමණ දිග වැලි වැටියක් සකස් කර තිබුණ ද, එය ස්ථිර විසඳුමක් නොවන බව නිරීක්ෂණය විය.

(ඒ) උඩප්පුව ග්‍රාමීය රෙජිස්ට්‍රාර් කොට්ඨාශය උතුරු පිටිගල් කෝරලයට අයත්වන බැවින්, විවාහ සිදුකර ගැනීමේ දී උතුරු පිටිගල් කෝරළයට අයත් දමිළ රෙජිස්ට්‍රාර් ගිහවිමේ ගැටළු ද ඇති බැවින්, උඩුප්පුව ග්‍රාමීය රෙජිස්ට්‍රාර් කොට්ඨාශය මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාල රෙජිස්ට්‍රාර් අංශය මඟින් පාලනය වීමත් උතුරු පිටිගල් කෝරළයෙන් වෙන්කර පුත්තලම් පත්තු විවාහ රෙජිස්ට්‍රාර් කොට්ඨාශය යටතේ විවාහ ලියාපදිංචිය කිරීමෙන් මෙම ගැටළුව විසඳිය හැකි ද යන්න ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මැදිහත්වී අනෙකුත් වගකිව යුතු ආයතනය ද සම්බන්ධීකරණය කර සළකා බලන සුදුසු ක්‍රියාමාර්ගයක් ගතයුතුව තිබුණ ද, දීර්ඝ කාලයක් තිස්සේ මේ පිළිබඳව අවධානයක් යොමුකර නොමැති බව විගණනයට නිරීක්ෂණය විය.

(ක) සපිරිගමක් ජනතා සහභාගීත්ව වැඩසටහනට අදාලව සංවර්ධන ව්‍යාපෘති 40 ක් සඳහා ප්‍රතිපාදන අනුමත වී තිබූ අතර, එයට අදාල ඇස්තමේන්තු සැකසීම වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරී විසින් සිදුකර තිබුණද, පසුව එම ව්‍යාපෘති ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කළයුතු බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් තීරණය කර තිබුණි. සැලසුම් අංශයේ මූල්‍ය හා මූල්‍ය නොවන සම්පත් වැයකර ඇස්තමේන්තු 40ක් සැකසීම ඵලරහිත කටයුත්තක් වී තිබුණි.

(ඛ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2020 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා විශේෂ කරුණු සාකච්ඡා කිරීමට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව රැස් වී නොතිබුණි.

(ග) මාර්ග ව්‍යාපෘතිවල ඉංජිනේරු ඇස්තමේන්තුවල ප්‍රධාන වැඩ විෂයයන් 04 ක් සඳහා සකස් කර ඇති විශේෂ සම්මත මිල අනුපාතයන්වල මිල විශ්ලේෂණයන් මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් මිල අනුපාතයන්ගේ නිවැරදිතාවය විගණනයට තහවුරු කරගත නොහැකි වූ අතර, එම ප්‍රධාන ද්‍රව්‍ය විශේෂයන් 04 ( බොරළු, ABC 1 ½" සහ ¾ " මැටල්) සඳහා ව්‍යාපෘති 91 ක් සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.38,147,454 ක් විය.

04. තිරසාර සංවර්ධනය

තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

පුත්තලම සහ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිය විෂයපථයට අදාලව තිරසාර සංවර්ධන අරමුණු සහ අරමුණු සම්බන්ධයෙන් වන ඉලක්ක, පාදක දත්ත සහ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හා තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාර්ය හා සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.

5 යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

මහකුඹුක්කඩවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මෙ දක්වා ගෙවීම් නොලද වකුගඩු දීමනා, වැඩිහිටි දීමනා හා ආබාධිත දීමනා සඳහා ලියාපදිංචි වූ පුද්ගලයින් 394 ක පොරොත්තු ලේඛනයක් නඩත්තු කර තිබුණ ද එම ගෙවීම් සඳහා අනුමැතිය ලබාගෙන ආධාර මුදල් ගෙවීමේ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

අනුයුක්තකාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ඒ යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල 16 හි අනුමත තථ්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. | ජ්‍යෙෂ්ඨ මට්ටම | 77 | 65 | 12 |
| ii. | තෘතියික මට්ටම | 58 | 35 | 23 |
| iii. | ද්විතියික මට්ටම | 1812 | 1465 | 347 |
| iv. | ප්‍රාථමික මට්ටම | 1981 | 133 | 33 |
| | එකතුව | 1947 | 1698 | 415 |

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 13 කට අදාලව සේවක පුරප්පාඩු සංඛ්‍යාව 25 ක් විය.

(ආ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 18 කට අදාලව සේවක පුරප්පාඩු 390 ක් පවතින බව නිරීක්ෂණය විය.

සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

# 04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක ( ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව )

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | **90% -100%** | **75% - 89%** | **50% - 74%** |
| මානව සම්පත් සංවර්ධන දේශීය හා විදේශීය පුහුණුව | | | 54% |
| ප්‍රසම්පාදන සැලැස්ම අනුගතවීම | | 99 % | |
| වාර්ෂික ඇස්තමේන්තු තුළින් සපයා ගන්නා ප්‍රතිපාදන ප්‍රශස්ත උපයෝජනය | 98% | | |
| දිස්ත්‍රික්කයට ලැබෙන සියළුම මූල්‍ය ප්‍රතිපාදන අපේක්ෂිත ඉලක්ක කරා මෙහෙයවීම | 96% | | |
| ප්‍රතිපාදන අරපිරිමෙස්මෙන් හා කාර්යක්ෂමව මෙහෙයවීම සම්බන්ධව අභ්‍යන්තර පාලනය | 98% | | |
| හරිත ඵලදායිතාව සහ පොලිතින් රහිත පරිසරය | | 76% | |
| තාක්ෂණය සහ මෘදුකාංග භාවිතය | | 85% | |
| ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මකවීම | | 75 % | |
| පරිසර සංරක්ෂන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | 80 % | |

# 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| **01. සෑම තැනකම සෑම ආකාරයකම දරිද්‍රතාව තුරන් කිරීම** | සියළුම ආකාරයේ දරිද්‍රතාවයන්ගෙන් පෙළෙන සියළුම වයස් කාණ්ඩවලට අයත් පිරිමින් කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය 2025 වනවිට අවම වශයෙන් අඩකින් අඩු කිරීම | • දරිද්‍රතාවෙන් පෙලෙන පවුල්වල රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් රැකියා ගත කිරීම<br>• පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>• ව්‍යාපාර ආරම්භ කිරීමට ණය ලබා දීම<br>• ආදායම් උත්පාදනයට යොමු කිරීම<br>• ගෘහ ඵලදායිතා වැඩසටහන් හඳුන්වාදීම, සම්බන්ධීකරණය<br>• මත් නිවාරණ දැණුවත් කිරීම්<br>• ස්වයං රැකියා ආධාර ලබා දීම හා යොමු කිරීම්<br>• ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්<br>• ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>• විගමනික පවුල්වල සාමාජිකයන්ව මූල්‍ය කළමණාකරණය පිළිබඳ දැනුවත් කිරීම<br>• අත්යන්ත්‍ර ඇඟළුම් කර්මාන්තය සවිබල ගැන්වීම | 44%<br>42% | 50%<br>54%<br>56%<br>63%<br>68%<br>70% | 80%<br>100%<br>100% |
| **02. සාගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාවය හා ඉහල පෝෂණ තත්ත්වයක් සාක්ෂාත් කර ගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.** | 2030 වර්ෂය වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන් දරුවන් ද ඇතුලත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන හා අවධානමට ලක්ව තිබෙන ජනතාවට ආරක්ෂාකාරි පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම | • ආහාර හා පෝෂණය පිළිබඳව දැනුවත් කිරීම්<br>• තරුණ කෘෂි ව්‍යවසායකයන් මෙහෙයවීම<br>• ලක්ෂ 10 අවම ආයෝජනයක් සහිත ගොවිපල ප්‍රවර්ධනය<br>• පාසල්දරුවන් අතර පළතුරු පැල බෙදාදීම<br>• පස හා ජල සංරක්ෂණය තුලින් ඌන පරිහරන කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාව ඉහල නැංවීම<br>• පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම<br>• කොස්පැල ලක්ෂයක් සිටුවීම | 45%<br>40% | 60%<br>68% | 100%<br>75%<br>90% |
| **03.නිරෝගී ජීවිතයක් තහවුරු කිරීම සහ සෑම වයසකදීම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම** | 2030 වන විට බෝනොවන රෝග නිසා සිදුවන අකල් මරණ ප්‍රතිකාර මඟින් හා වලක්වා ගැනීමේ ක්‍රම මඟින් 1/3 කින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම | • මද්‍යසාර හා මත් ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සහ සාරධර්ම අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම<br>• උපදේශන ජංගම සායන පැවැත්වීම<br>• ගුරු ශිෂ්‍ය දෙමාපිය ප්‍රවර්ධන වැඩසටහන<br>• ක්‍රීඩා තරඟ පැවැත්වීම<br>• වෛද්‍ය සායන පැවැත්වීම<br>• ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය<br>• ක්‍රීඩා උපකරණ ලබාදීම සහ ක්‍රීඩා පුහුණුව සිදු කිරීම<br>• සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ශරීර සුවතා මධ්‍යස්ථාන ඉදිකිරීම. | | 73%<br>70%<br>60% | 80%<br>80%<br>75%<br>82%<br>95% |

| | | | | | |
|---|---|---|---|---|---|
| **04.පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීම තහවුරු කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ප්‍රවර්ධනය කිරීම.** | 2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම . | • ද්විතීය අධ්‍යාපනයෙන් පසු ඵලදායී තෘතීය අධ්‍යාපනයට යොමු කිරීම<br>• සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ලබා දීම<br>• දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම<br>• ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ලබා දීම | | 50%<br>68% | 75%<br>90% |
| **05.ස්ත්‍රී, පුරුෂ සමානාත්මකතාවය අත්පත් කර ගැනීම සහ සියළු කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.** | කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහිව සියළුම ස්ථානවල සිදු වන්නා වූ සියළුම ආකාරයකම වෙනස්කොට සැලකීම් තුරන් කිරීම. | • හිංසනයට මුහුණ දෙන්නන් වෙනුවෙන් මනෝ සමාජීය උපදේශන සහාය ශක්තිමත් කිරිම<br>• ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ දැනුවත් කිරීම<br>• විගමනික පවුල්වල සාමාජිකයන්ට දරුවන්ගේ සුරක්ෂිත තාවය සම්බන්ධව දැනුවත් කිරීම<br>• පාසල තුල ළමා ආරක්ෂක කමිටු ස්ථාපිත කිරීම<br>• අවධානමට ලක්ව සිටින දරුවන් සුරක්ෂිත කිරීමට අන්තර්ජාල මෘදු පද්ධතිය ස්ථාපිත කිරීම | | | 100%<br>100%<br>100%<br>80%<br>90% |
| **06. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරිම .** | 2030 වන විට සියළු දෙනාටම සමානත්වයෙන් යුක්තව සනීපාරක්ෂාව සහ ස්වස්තතාව ලබා ගැනීමට හැකියාව සහ එළිමහනේ මළපහ කිරීම තුරන් කිරීම සහ විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ගැහැණු ළමුන්ගේ සහ අවධානමට ලක් වී සිටින පුද්ගලයන්ගේ විශේෂ අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කිරීම . | • සෞඛ්‍ය ආරක්ෂිත වැසිකිලි නොමැති පවුල් සඳහා වැසිකිලි ඉදිකිරීම.<br>• පාසල් දරුවන් හා වැඩිහිටියන් දැනුවත් කිරීමේවැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• පාසල් ළමුන් අතර පෝස්ටර් හා චිත්‍ර තරඟ පැවැත්වීම<br>• රාජ්‍ය නොවන සංවිධානවල අවධානයට යොමු කර අවශ්‍ය පහසුකම් සැපයීම | 45% | 60%<br>60%<br>73% | |
| **07. සියල්ලන් සඳහා දැරිය හැකි විශ්වාසනීය,තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරිම** | 2030 වන විට සියළු දෙනාටම අඩු මිලකට ලබා ගත හැකි විශ්වාසදායි නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකි බව තහවුරු කිරීම. | • විදුලිය නොමැති පවුල් වලට විදුලිය ලබාදීමට ක්‍රමවේදයක් සැකසීම<br>• පුනර්ජනණීය බලශක්ති ප්‍රභවයන් වෙත ජනතාව යොමු කිරීම<br>• ගොවි බිම් සඳහා සූර්ය බලයෙන් ක්‍රියා කරන වතුර මෝටර් සැපයීම | | | 95%<br>80%<br>90% |
| **08. සියල්ලන් සඳහාම පෝෂිත පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායිව සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.** | ළමා ශ්‍රමය තහනම් කිරීම, කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම, සියළු සේවකයන් සඳහා ආරක්ෂාකාරි සේවා පරිසරයක් තිබීම ප්‍රවර්ධනය කිරීම | • වෘත්තීය මාර්ගෝපදේශ සේවා ලබා දීම හා ව්‍යවසායකත්ව සංවර්ධනය<br>• වයස අවු 18-60 ත් අතර පුද්ගලයන් හඳුනාගෙන රැකියා අවස්ථාව සැලසීම සඳහා පුහුණු කිරීම<br>• වැඩිහිටි ව්‍යවසායකයන්ගේ තොරතුරු ලබාගැනීම හා හඳුනාගැනීම | | 70% | 100%<br>75% |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • ළමා ආරක්ෂණ ජාලයක් ග්‍රාමීය මට්ටමින් ස්ථාපිත කිරීම | | | 75% |
| 09. **සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම.** | සංවර්ධන වෙමින් පවත්නා රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය,පර්යේෂණ සහ නවෝත්පාදනය සඳහා සහය ලබා දීම, එකිනෙකා අතර කර්මාන්ත විවිධාංගිකරණය සහ නිෂ්පාදනයන් සඳහා වටිනාකම එකතු කිරීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති වාතාවරණයක් සැකසීම. | • තාක්ෂණික පුහුණුවීම් සඳහා යොමු කිරීම<br>• දේශීය තාක්ෂණික සංවර්ධනයන්ට මූලාධාර සැපයීම<br>• වෙළඳපලට පිවිසීමට අවශ්‍ය සහය ලබාදීම<br>• යටිතල පහසුකම් සංවර්ධනය<br>• කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යසායකින් බිහිකිරීම අරමුණින් Business Desk වැඩසටහන ක්‍රියාත්මක කිරීම<br>• පාසල් හැරයන තරුණ තරුණියන් වෘත්තිමය කුසලතා වර්ධනයට උපායමාර්ගික සැලැස්ම(Lead to Leed) ක්‍රියාත්මක කිරීම | | 60%<br>70% | 90%<br>75%<br>85%<br>82% |
| **10.** **රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම** | 2030 වන විට වයස,ලිංගික බව,ආබාධිත බව, ජන වර්ගය,ජාතිය,ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්වයක් පිළිබඳව තැකීමකින් තොරව සියළුදෙනාගේ සමාජ ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම | • සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රියාත්මක කිරීම<br>• සහජීවන සංගම් පිහිටුවීම හා සහජීවන කර්තවයන් ක්‍රියාත්මක කිරීම<br>• සවිබල ගැන්විය යුතු පාර්ශවයන් සවිබල ගැන්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම | | | 100%<br>100%<br>90% |
| **11.** **නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත,සවිමත් සහ තිරසර ලෙස සකස් කිරිම.** | 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුලත්ව නගරය නිසා සිදුවන ඒක පුද්ගල අහිතකර බලපෑම අඩු කිරීම.ෙ | • ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම<br>• ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකක පිහිටුවීම<br>• පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීම | | 70%<br>50% | 75% |
| 12. **තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.** | 2030 වන විට අප ද්‍රව්‍ය උත්පාදනය වීම වැලැක්වීම , අඩු කිරීම, ප්‍රතිචක්‍රීයකරණය සහ ඒවා නැවත භාවිතා කිරීම මඟින් අඩු කිරීම. | • ආයතනික, කොට්ඨාස හා දිස්ත්‍රික්ක මට්ටමින් ව්‍යාපෘති සිදු කිරීම<br>• ඝන අප ද්‍රව්‍ය කළමනාකරණ ඒකක පිහිටුවීම<br>• පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | | 60%<br>50% | 80% |
| 13. **දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව** | දේශගුණික බලපෑම්වලට ලක්වන පවුල් ප්‍රමාණය | • දැඩි නියං තත්වය මත ජලය සපයා ගත නොහැකි ප්‍රදේශ වෙත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | | 70% | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **කඩිනමින් ක්‍රියාත්මක කිරීම.** | වාර්ෂිකව 10% දක්වා අඩුකිරීම | • ගංවතුර නිසා නිරන්තර සිදුවන හානි අවම කිරීමට අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම<br>• රුක් රෝපණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | | | 100%<br>100% |
| **14. තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායි භාවිතය** | සාගරයට එකතුවන අපද්‍රව්‍ය (නොදිරන ) ප්‍රමාණය 20% දක්වා අඩුකිරීම | • සාගර සම්පත් සංරක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>• වෙරළ පවිත්‍රතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | | 100%<br>100% |
| **15. භූගෝලීය පරිසර පද්ධතින්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරිකරණයට එරෙහිව ක්‍රියාකිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම.** | ජීව විවිධත්වයන් සහ පරිසර පද්ධති සංරක්ෂණ කිරීමට සහ තිරසර අන්දමින් භාවිතා කිරීමට සියලුම මූලාශ්‍රයන්ගෙන් මූල්‍ය ප්‍රතිපාදන රැස් කිරීමට උනන්දු කිරීම | • වියළි කලාපයේ විල්ලු ආශ්‍රිත පරිසර පද්ධතියේ ජෛව විවිධත්වය සංරක්ෂනයට සහ තිරසර භාවිතයට ප්‍රජාව හුරු කිරීම<br>• පරිසර සංවේදී කලාපයේ කෘෂිකාර්මික පිළිවෙත් ඇති කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (ESA)<br>• ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>• රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | | 100%<br>100%<br>100%<br>100% |
| 16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායි වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැගීම. | උපත් ලියාපදිංචි කිරීමද ඇතුළුව 2030 වන විට සියළු දෙනාටම නීතිමය අනන්‍යතාවක් ලබාදීම | • කල්ගතවූ උපත් හා විවාහ ලියාපදිංචි කිරීමේ ජංගම සේවා පැවැත්වීම<br>• ජාතික හැඳුනුම්පත් ලබාදීමේ ජංගම සේවා පැවැත්වීම<br>• ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | | | 100%<br>100%<br>100% |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

**ජයග්‍රහණ**

1. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාසායකින් බිහිකිරීමේ අරමුණින් Business Desk වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
2. පාසල් හැර යන තරුණ තරුණියන් වෘත්තිමය කුසලතාවන්ගෙන් පිරිපුන් කිරීම සඳහා උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම. (Lead to Leed).
3. ආබාධිත ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා මොබිටල් සමාගම හා එකාබද්ධ වෙමින් අලෙවි නියෝජිතවරුන් ලෙස පුහුණු කර බඳවා ගැනීම.
4. අත්යන්ත්‍ර ඇඟළුම් නිෂ්පාදනය ප්‍රවර්ධන සඳහා අවශ්‍ය කම්හල් පහසුකම් සංවර්ධනය.

**අභියෝග**

1. දරිද්‍රතාවය ඉහල යාමට, සෞඛ්‍ය සම්පන්න නිරෝගි ජීවිත අහිමි වීමට, ගුණාත්මක අධ්‍යාපනයක් අහිමි වීමට ආදි වූ කරුණු රාශියකට හේතුවක් වූ මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට විවිධ වූ දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වූවද මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වන පිරිස දිනෙන් දින වැඩිවීම සිදුව ඇත.

2. සියළුම ජනතාවට ආරක්ෂිත පෝෂ්‍යදායි ප්‍රමාණවත් ආහාර ලැබීම තහවුරු කිරීම සාක්ෂාත් කිරීම ප්‍රබල ගැටළුවක්ව පවතින්නේ වසරේ වැඩි කාලයක් වියළි දේශගුණයක් පවතින පුත්තලම දිස්ත්‍රික්කය තුල ඇතිවන නියඟ තත්වය නිසා ගොවිතැන් විනාශ වීම සහ සතුන් විසින් ගොවිතැනට හානි කිරීම

3. මධ්‍යම පළාතට, කුරුණෑගල දිස්ත්‍රික්කයට හා අනුරාධපුර දිස්ත්‍රික්කය යන ප්‍රදේශ වලට ඇදහැලෙන අධික වැසි ජලය පුත්තලම දිස්ත්‍රික්කය හරහා මුහුදට ගලා බසියි. පුත්තලමට අධික වැසි ඇති නොවූවද දිස්ත්‍රික්කයේ පවතින භූගෝලීය පිහිටීම නිසා ගංවතුර ආපදාවන්ට නිරන්තරයෙන් මුහුණ දීමට සිදුවීම අභියෝගයකි.

4. 2020 වසර තුල මුහුණු දුන් ගොලීය වසංගත තත්වය ප්‍රධාන අභියෝග විය.

# 6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 56 | 51 | 05 |
| තෘතියික | 40 | 24 | 16 |
| ද්විතියික | 1154 | 1002 | 152 |
| ප්‍රාථමික | 177 | 133 | 44 |

## 6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

දැනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාළ අංශ වෙත තොරතුරු දැනුම් දී ඇත. ජ්‍යෙෂ්ඨ සහ තෘතික පුරප්පාඩු තනතුර වලට අදාළ රාජකාරි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අභ්‍යන්තර වැඩපිළිවෙලක් යොදා ඇත. (රාජකාරි ආවරණ ,වැඩ බැලීම, රාජකාරි ඉටුකිරීම ) ද්විතීයික නිලධාරින්ගේ පුරප්පාඩු සඳහා අභ්‍යාසලාභි උපාධිධාරි නිලධාරින් යොදවා රාජකාරි අඛණ්ඩව ක්‍රියාත්මක කරයි.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| අනු අංකය | වැඩ සටහන | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව(දින) | සමස්ථ ආයෝජනය | වැඩසටහන් ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | | |
| 1 | පොදු ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | 03 | අවු-01 | 360,000.00 | දේශීය | අදාළ විෂයයන් කුසලතා වර්ධනවීම හේතුවෙන් විෂය රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම |
| 2 | ඉදිකිරීම් කර්මාන්ත සම්බන්ධ පුහුණු පාඨමාලාව | 02 | 01 | 10,000.00 | දේශීය | අදාළ විෂයයන් කුසලතා වර්ධනවීම හේතුවෙන් විෂය රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම |
| 3 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ආධුනික නිලධාරි පුහුණුව | 05 | 01 | 15,505.00 | දේශීය | රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම |
| 4 | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම් පුහුණු පාඨමාලාව | 05 | 03 | 60,000.00 | දේශිය | රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම |
| 5 | මැනීම් හා මට්ටම් ගැනීම පිළිබඳ ප්‍රායෝගික දැනුම හා පුහුණුව | 01 | 01 | 6,735.00 | දේශිය | රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම |
| 6 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ආධුනික නිලධාරි පුහුණුව | 05 | 01 | 4.980.00 | දේශිය | රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම |
| 7 | වාහන නඩත්තුව<br>හා අළුත්වැඩියාව පිළිබඳව පුහුණුව | 50 | 01 | 11,785.00 | දේශිය | රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම |
| 8 | රාජ්‍ය සේවයේ විනය කාර්යය පටිපාටිය | 1 | 03 | 18,000.00 | දේශිය | අදාළ විෂයයන් කුසලතා වර්ධනවීම හේතුවෙන් විෂය රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම |
| 9 | වැටුප් සකස්කිරිම මූලික පාඪමාලාව | 1 | 03 | 18,000.00 | දේශිය | අදාළ විෂයයන් කුසලතා වර්ධනවීම හේතුවෙන් විෂය රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම |
| 10 | රියදුරන් සඳහා එක් දින වැඩමුළුව | 1 | 01 | 3,500.00 | දේශීය | විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම |
| 11 | ඵලදායිතා පුහුණු වැඩසටහන් | 80 | 01 | 8,250.00 | දේශිය | ඵලදායිතා අයදුම්පත්‍ර සකස් කිරිම හා ආයාතනයේ ඵලදායිතාව වැඩිවීම |
| 12 | විනය කාර්ය පටිපාටිය පිළිබඳ මාර්ගගත පුහුණු | 02 | 03 | 10,000.00 | දේශිය | නිලධාරින්ගේ විනය පිළිබඳව නිවැරදි දැනුමක් ලබා ගත හැකි වීම. |

## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාල නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නැත | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නැත | | |
| 1.6 | වෙනත් | අදාල නැත | | |
| **2** | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය ( GA – N 20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.01 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අය වැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| **5.1** | විගණනකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව ,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේක 1-2019 අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේකයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වැනි පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත් කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 216/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | වසර ගණනාවක ට පෙර සිට පැවත එන හිඟ හිටි ණය ශෙෂ ඇත.එම ණය ශේෂය කපාගැනීම ට අවශ්‍ය කටයුතු කරමින් තිබේ. | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක නර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20** | **විද්‍යුත් පළාත් පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම** | | | |
| 20.1 | 2018.07.19 දිනැති පළාත් පාලන චක්‍ර ලේක අංක 2018/e-Local Government-01 අනුව අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා තිබීම . | අදාල නොවේ. | | |
| 20.2 | අන්තර් ජාලය හරහා ගෙවීම් සිදුකිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා තිබීම . | අදාල නොවේ. | | |
| 20.3 | පාරිභොගින්ට හිතකර සේවාව සැපයීමෙ සඳහා පෙරටු කාර්යාලය හා (Front Offices) පාරිභොගික සේවා මධ්‍යස්ථානය හඳුන්වා දී තිබීම. | අදාල නොවේ. | | |